සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

57	S	I

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 13 - 2018

විභාග අංකය ..... නාට්‍ය හා රංගකලාව I කාලය පැය තුනයි

උපදෙස්

- I කොටස II කොටසෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- II කොටස A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

I කොටස

- **නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

01. පහත සඳහන් ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය වන්නේ,
1. කලාව සෞන්දර්යාත්මක නිර්මාණයකි.
2. විද්‍යාව යනු දැනුම හා බුද්ධිය පුළුල් කරන්නකි.
3. කලාව යනු භාව ප්‍රකෝප කරන්නකි.
4. ශිල්ප යනු පුරුදු පුහුණු කළ යුක්තකි.
5. කලාව යනු බුද්ධියට ආමන්ත්‍රණය කරන රස ජනකයකි. (.....)

02. ප්‍රාසංගික කලාවන් වීමට අත්‍යාවශ්‍ය නොවන සාධකය වන්නේ,
1. සජීවී කලාවන් විය යුතුයි.
2. ජීවමාන ප්‍රේක්ෂක පිරිසක් අත්‍යාවශ්‍ය වේ.
3. චතුර් අභිනය උචිත පරිදි යොදා ගැනේ.
4. අනෙකුත් කලාවන් මත යැපෙන පරායත්ත කලාවක් නොවේ.
5. නිශ්චිත ස්ථානයක ඉදිරිපත් කළ යුතුයි. (.....)

03. බැලේ නාට්‍ය පිළිබඳව නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. චෛකොවිස්කි විසින් ස්වෝන් ලේක් බැලේ නාටකය සංගීතවත් කර ඇත.
2. රෝමියෝ ජුලියට් යනු සුප්‍රසිද්ධ බැලේ නාටකයකි.
3. බැලේ නාටක වල ප්‍රධාන ම මාධ්‍යය ගායනයයි.
4. අපරදිග නෘත්‍ය නාටක ලෙස ද මෙය හඳුන්වනු ලබයි.
5. පසුබිම් දර්ශණ ප්‍රධාන අනුශාංගික කලාවක් ලෙස භාවිතා නොකරයි. (.....)

04. ශ්‍රී ලංකාවට ආවේණික ශෛලියකින් යුත් ඔපෙරා ලෙස නිර්මාණය වී ඇත්තේ,
1. දිට්ඨමංගලිකා හා සැලලිහිණි සංදේශය
2. මානසවිල හා අග්නි
3. ලයිලා සහ මජ්නු
4. හංසවිල හා නිදිකුමාරි
5. ඉලෙක්ට්‍රා හා ඊඩිපස් (.....)

05. කරදිය හා නල දමයන්ති යන මුද්‍රා නාට්‍ය දෙකෙහි සංගීතය නිර්මාණය කරන ලද්දේ,

1. ලයනල් අල්ගම මහතා ය.
2. ෂෙල්ටන් ප්‍රේමරත්න මහතා ය.
3. ඔස්ටින් මුණසිංහ මහතා ය.
4. ප්‍රේමසිරි කේමදාස මහතා ය.
5. ඩබ්ලිව්.ඩී. අමරදේව මහතා ය. (.....)

06. ගීත නාටක සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

1. ගීතයේ අර්ථය තීව්‍ර කරනු වස් ආංගික අභිනය යොදාගන්නා මාධ්‍යයකි.
2. ගායනයට ප්‍රමුඛත්වය හිමිවන නාට්‍ය විශේෂයකි.
3. පා ඇඟිලි තුඩු මත සිට ගායනය ඉදිරිපත් කෙරෙන කලාවකි.
4. බටහිර ඔපෙරා වල ආභාෂය ලබා ඇත.
5. දෙපානෝ සහ කැලෑමල් ප්‍රකට ගීත නාටක දෙකකි. (.....)

07. නෘත්ත, නෘත්‍ය, නාට්‍ය වශයෙන් වන අර්ථ නිරූපණය පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් වැරදි පිළිතුර වන්නේ,

1. නාට්‍යයේ ප්‍රමුඛත්වය හිමිවන්නේ රූපණයටයි.
2. ධනංජයගේ දශරූපයෙහි මේ පිළිබඳව සඳහන් වේ.
3. නෘත්‍යයෙන් කිසියම් වූ භාවයක් ප්‍රකට කෙරේ.
4. නෘත්ත යනු ශුද්ධ නැටුම හෙවත් රිද්මයානුකූල ගාත්‍රා වික්ෂේපයක් පමණක් නොවේ.
5. මෙම වචනය ප්‍රභවය වී ඇත්තේ 'නෘත්' හා 'නට්' ධාතු වලිනි. (.....)

08. ආංගික අභිනයේ ප්‍රභේද නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

1. චාරි, ස්ථානක, හස්තාකරණ
2. අංග, අනුඅංග, ප්‍රත්‍යංග, උපාංග
3. ස්ථම්භ, වේපථු, ප්‍රලය, කරණ
4. සන්ධිම, වෙෂ්ටිම, ස්ථම්භ, ස්වරභංග
5. පුස්ත, ප්‍රලය, හස්ත, කරණ (.....)

09. නාට්‍ය අධ්‍යක්ෂක සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

1. නාට්‍යයේ අර්ථපති ලෙස ක්‍රියා කල හැක.
2. නාට්‍යයේ සර්ව බලධාරියා ය.
3. පෙළ සජීවිකරණයට ලක් කරන්නාය.
4. අනිවාර්යයෙන් ම පෙළ රචකයා අධ්‍යක්ෂවරයා ම විය යුතුය.
5. නාට්‍ය නිෂ්පාදනය සම්බන්ධ මූලික වගකීම දරන්නා ය. (.....)

10. 'රූපණය' සම්බන්ධයෙන් විවිධ විද්වතුන් විවිධ ප්‍රකාශනයන් ඉදිරිපත් කර ඇත. පහත ප්‍රකාශ අතුරින් වැරදි පිළිතුර වන්නේ,

1. බර්ටෝල්ට් බ්‍රෙස්ට් නළුවා බුද්ධිමය ප්‍රතික්‍රියාවක් දක්වන්නෙකු ලෙස රූපණයේ යෙදිය යුතු බව ප්‍රකාශ කරයි.
2. චරිතයකට ආරෝපණය වී කිසියම් කාල සීමාවක් එහි ජීවත් විය යුතු බව ස්ටැනිස්ලාව්ස්කි ප්‍රකාශ කරයි.
3. නළුවා වේදිකාව මත ප්‍රේක්ෂකයන් ඉදිරියේ රඟපෑම නොව ජීවත් වීම කල යුතු බව එමිල් සෝලාගේ අදහසයි.
4. පංචේන්ද්‍රියන් ආශ්‍රය කොටගෙන කෙරෙන පංච වේදිතයන් රූපණය මගින් ඉදිපරිත් කළ යුතු බව භරතමුණි පවසයි.
5. ඕගස්ට් ස්ට්‍රින්බ(ර්)ග් ගේ 'නළුවෙකුගේ පෙරහුරුව' රූපණය සම්බන්ධව ලියැවී ඇති ග්‍රන්ථයකි. (.....)

11. බහුවර්ණ උපද්දවන ආලෝක උපකරණය වන්නේ,

1. අල්ට්‍රා වයලට් පහන
2. වර්ණ චක්‍රය
3. අලෝක බුබුළු වැට
4. බීම් ලයිට්
5. හැලජන් පහන

(.....)

12. නාට්‍ය ගීතයක් නොවන්නේ,

1. ඇසට නැතේ දකිනේ පුතු මාගේ
2. අම්බරයේ සඳ සේ දිළී රූපාවති
3. අද වෙස්සන්තර රාජ පුතා
4. ලෙංචිනා මගේ නංගියේ ඇයි
5. තට්ටු කරන්න හෙමින්

(.....)

13. 'ප්‍රේක්ෂකයා මුල් වරට චරිතය හඳුනා ගන්නේ බාහිර සමාරෝපය තුළිනි.' බාහිර සමාරෝපයට අයත් ප්‍රධාන සාධක දෙක වන්නේ,

1. රංගභූමි අලංකරණ හා වේෂභූෂණයයි.
2. වේෂභූෂණ හා අංග රචනයයි.
3. රංගභූමි ආලෝකය හා අංගරචනයයි.
4. රංග විනාසය හා රංග වස්ත්‍රයයි.
5. නාට්‍යෝපකරණ හා අංගරචනයයි.

(.....)

14. භීතිය, ත්‍රාසය, විශ්මය ගැටුම් අවස්ථා මෙන්ම සියුම් භාව ප්‍රකාශන දැන්වීම සඳහා රංගභූමි තාක්ෂණය බහුලව යොදා ගනී. පහත ප්‍රකාශ අතුරින් වැරදි පිළිතුර වන්නේ,

1. ධර්මජිත් පුනර්ජීව ලිහිණි නාට්‍යයේ අල්ට්‍රාවයලට් පහන භාවිතා කරයි.
2. හෙන්රි ජයසේනයන් 'අපට පුතේ මගක් නැතේ' නාට්‍යයේ 'ෂැඩෝ ලයිට්' භාවිතා කර ඇත.
3. ජනක් ප්‍රේමලාල්ගේ රාජකපුරු නාට්‍යයේ සුදු ඇතා කෝප වූ බව දැන්වීමට ආලෝකය රතු පැහැයට හරවනු ලබයි.
4. ධර්මසිරි බණ්ඩාරනායක ගේ 'ට්‍රෝජන් කාන්තාවෝ' නාට්‍යයේ වර්ණ සංකලනය සඳහා පරිගණකය භාවිතා කර ඇත.
5. මනමේ නාට්‍යයේ පොතේ ගුරු ඉස්මතු කර දැක්වීමට ධාරා පහන් භාවිතා කරයි.

(.....)

15. ලංකාවේ ප්‍රචලිත වේදිකා නාට්‍යයන්හි රංගභූමි පසුතල සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

1. කැලණි පාලම නාට්‍යයේ පැල්පත් 02 හා පහන් කණුවක් ඇත.
2. තලමල පිපිලා නාට්‍යයේ වේදිකාව මධ්‍යයේ නුග ගහක් ඇත.
3. සිංහබාහු නාට්‍යයේ වේදිකාවේ වම් පස ඉදිරියෙහි ගල් ලෙනක් නිර්මාණය කර ඇත.
4. සුබ සහ යස නාට්‍යයේ වේදිකාව මධ්‍යයෙහි සයනයක් ඇත.
5. සෙවනැලි හා මිනිස්සු නාට්‍යයේ පෙට්ටගම හා අට්ටාල 02 ක් ඇත.

(.....)

- **පහත දැක්වෙන මාතෘකා ඇසුරින් අංක 16 සිට 21 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - ප්‍රත්‍යාවර්තනය	B - ප්‍රාසාංගික	C - මිරැකල්
D - ග්ලෝබ්	E - ඔන්කෝස්	F - බුත් වේදිකා
G - නාටක	H - සංවේශ පුහුණුව	I - ජෝ - හ- ක්‍යු
J - අවසන් භෝජන සංග්‍රහ	k - ධීර ලලිත	L - තෙස්පීස්
M - රංග රචනය	N - හෂිගකරි	O - උපරි වේදිකාව
P - රංගභූමි තාක්ෂණය	Q - තයිකෝ	R - 'ඉන්' රංගශාලා

16. මධ්‍යකාලීන නාට්‍යකලාව හා සම්බන්ධ වන්නේ,

1. C, D හා O 2. C, F හා J 3. D, J හා Q
4. D, L හා O 5. J, N හා Q (.....)

17. සංස්කෘත නාට්‍යකලාව හා සම්බන්ධ වන්නේ,

1. B, G හා K 2. C, G හා K 3. E, J හා K
4. G, L හා M 5. K, D හා Q (.....)

18. ග්‍රීක නාට්‍යකලාව හා සම්බන්ධ වන්නේ,

1. A, H හා L 2. A, E හා L 3. D, F හා L
4. E, D හා Q 5. E, J හා N (.....)

19. එලිසැබතන් නාට්‍ය හා සම්බන්ධ වන්නේ,

1. C, E හා O 2. C, N හා R 3. D, M හා O
4. D, J හා Q 5. D, O හා R (.....)

20. පොදුවේ නාට්‍යකලාව හා සම්බන්ධ වන්නේ,

1. B, H හා Q 2. D , M හා P 3. F , M හා O
4. H,N හා Q 5. I, O හා P (.....)

21. ජපන් නාට්‍ය කලාව හා සම්බන්ධ වන්නේ,

1. D, J හා L 2. E, I හා Q 3. F, I හා N
4. H,N හා Q 5. I, N හා Q (.....)

22. රුක්මනී දේවි රංගනයෙන් දායකත්වය සැපයූ නාට්‍ය සම්ප්‍රදාය වන්නේ,

1. නාඩගම් 2. නූර්ති 3. පාස්කු
4. ටීටර් හා මිනර්වා 5. ටවර්හෝල් (.....)

23. ලංකා විශ්වවිද්‍යාලීය නාට්‍ය සංගමයෙන් නිෂ්පාදනය වූ 'ලිලියොම්' නාට්‍යයේ නිෂ්පාදකවරයා වන්නේ,

1. ඊ.එෆ්.සී. ලුඩෝවයික් 2. නියුමාන් ජුබාල් 3. රොබට් ජී. නියුටන්
4. ඇෂ්ලි හල්පේ 5. ක්ලෝඩඩ් ජයවර්ධන (.....)

24. නීතිඥ ජොන්ද සිල්වාගේ නූර්ති ඇතුලත් ගොනුව වන්නේ,

1. රාමායනය, සිරිසඟබෝ, වෙස්සන්තර 2. විධුර, පද්මාවතී, රාමායනය
3. සඳ කිඳුරු, රොලීනා, විධුර 4. රෝමියෝ ජුලියට්, හේමමාලි, දුටුගැමුණු
5. දුටුගැමුණු, පද්මවතී, නාගානන්ද (.....)

25. පිටිපන, දූව, බොරලැස්ස ආදී ප්‍රදේශ වල ප්‍රචලිත නාට්‍ය සම්ප්‍රදාය වන්නේ,

1. නාඩගම් 2. කෝලම් 3. පාස්කු
4. රූකඩ 5. ජයමාන්න නාට්‍ය (.....)

- **පහත දැක්වෙන වගුව ආශ්‍රයෙන් අංක 26 - සිට 30 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

	මුල් නාට්‍යය	**රචකයා**	**සිංහල පරිවර්තනය / අනුවර්තනය**	**පරිවර්තක / අනුවර්තක**
ආ	ම(ර්)චන්ට් ඔෆ් වෙනිස්	විලියම් ශේක්ස්පියර්	වැනීසියේ වෙළෙන්දා	A
ආ	වේටින් ෆෝර් ගොඩෝ	B	ගොඩෝ උන්නැහේ එනකං	සුගලපාල ද සිල්වා
ඉ	ගුඩ් වුමන් ඔෆ් සෙට්සුවාන්	C	දේවතා එළි	ගුණසේන ගලප්පත්ති
ඊ	D	ඇන්ටන් චෙකෝෆ්	මහගෙදර	රංජිත් ධර්මකීර්ති
උ	ද ඩ්‍රැගන්	යෙවුගිනි ෂවාර්ට්ස්	E	හෙන්රි ජයසේන

26. 'අ' පේළියේ A අක්ෂරයට සුදුසු වරණය වන්නේ,
1. ජයලත් මනෝරත්න 2. බන්දුල විතානගේ 3. දයානන්ද ගුණවර්ධන
4. ගුණසේන ගලප්පත්ති 5. රංජිත් ධර්මකීර්ති (.....)

27. 'ආ' පේළියේ B අක්ෂරයට සුදුසු වරණය තෝරන්න.
1. සැමුවෙල් බෙකට් 2. ඉයුජින් අයනෙස්කෝ 3. හැරල්ඩ් ප්‍රින්ටර්
4. ඇලෙක්සැන්ඩර් ඩූමා 5. ටෙනිසි විලියම් (.....)

28. 'ඉ' පේළියේ C අක්ෂරයට සුදුසු වරණය වන්නේ,
1. ඇන්ටන් චෙකෝෆ් 2. හෙන්රික් ඉබ්සන් 3. අර්වින් පිස්කැටර්
4. බර්ටෝල්ට් බ්‍රේෂ්ට් 5. ෂෝන් පෝල් සාත්‍රේ (.....)

29. 'ඊ' පේළියේ D අක්ෂරයට සුදුසු වරණය වන්නේ,
1. පබ්ලික් එනමි 2. අන්කල් වාන්‍යා 3. ග්ලාස් මෙනජරි
4. සමාජයේ කුළුණු 5. චෙරි ඔච(ර්)ඩ් (.....)

30. 'උ' පේළියේ E අක්ෂරයට සුදුසු වරණය වන්නේ,
1. මකරාක්ෂයා 2. මරාසාද් 3. නැංගුරම්
4. මේඝ 5. මකරා (.....)

31. නළුවන් හා නළු වෘත්තීය නීත්‍යානුකූලව පිළිගැනීමට ලක් වූයේ,
1. එලිසැබතන් යුගයේ ය. 2. පුනරුද යුගයේ ය. 3. අඳුරු යුගයේ ය.
4. කාර්මික යුගයේ ය. 5. මධ්‍යකාලීන යුගයේ ය. (.....)

32. භරතමුණිගේ රස සිද්ධාන්තයට අයත් නොවන රසය හා භාවය වන්නේ,
1. ක්‍රෝධ භාවය හා රෞද්‍ර රසය. 2. භය භාවය හා භයානක රසය.
3. උත්සාහය භාවය හා වීර රසය. 4. ශ්‍රම භාවය හා ශාන්ත රසය.
5. ජුගුප්සා භාවය හා බිභත්ස්‍ය රසය. (.....)

33. ග්‍රීක රංගභූමියට අයත් අංගයක් වන්නේ,
1. මත්තවාරණී 2. මවරිබුතයි 3. ස්කීනියා ප්‍රොන්ස්
4. කේවියා 5. පැරඩෝස් (.....)

34. ජුලියස් සීසර් නාට්‍ය රචනා වූ වර්ෂය වනුයේ,

1. 1558 2. 1601 3. 1580
4. 1616 5. 1705 (.....)

35. වස්තුව නාට්‍යයේ ශරීරය ලෙස හඳුන්වා ඇත්තේ,

1. හෙන්රික් ඉබ්සන් ය. 2. කාලිදාසය. 3. භරතමුණි ය.
4. ඇරිස්ටෝටල් ය. 5. දංජුරෝය (.....)

36. අසම්මත නාට්‍ය සංකල්පය ප්‍රථම වතාවට එළිදැක්වූ ග්‍රන්ථය වන්නේ,

1. ඇරිස්ටෝල්ගේ කාව්‍ය ශාස්ත්‍රයයි.
2. භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයයි.
3. ඇල්බෙයා කැමූගේ ද මිත් ඔෆ් සිසිපස් ග්‍රන්ථය.
4. මාර්ටින් එස්ලීන් ගේ ද තියට(ර්) ඔෆ් ඇබ්සර්ඩ් ග්‍රන්ථය
5. සැමුවෙල් බෙකට් ගේ ද වේටිං ෆෝ ගොඩෝ ග්‍රන්ථයයි. (.....)

37. එපික් රංගයේ නිර්මාතෘවරයා වන්නේ,

1. අරවින් පිස්කැටෝර් ය. 2. ආතර් මිලර් ය. 3. බර්නාඩ් ෂෝ ය.
4. සැමුවෙල් බෙකට් ය. 5. ඇලඩයිස් නිකොල් ය. (.....)

38. ශ්‍රී හර්ෂදේවයන් විසින් රචිත සංස්කෘත නාට්‍ය ගොනුව වන්නේ,

1. ප්‍රියදර්ශිකා, නාගානන්දය, බාල චරිතය.
2. ස්වප්න වාසවදත්තා, රත්නාවලි, මැටිකරත්තය
3. රත්නාවලී, මාලවිකාග්නි මිත්‍ර, වික්‍රමෝර්වශිය.
4. ප්‍රියදර්ශිකා, රත්නාවලී, නාගානන්දය
5. රත්නාවලී, උත්තරාම චරිතය, නාගානන්දය (.....)

39. ළමා නාට්‍ය ගොනුව වන්නේ,

1. අපට පුතේ මඟක් නැතේ, අන්දරේලා, බූරුවා මහත්තයා
2. තොප්පි වෙළෙන්දා, නෙළුම් කුමාරි, ටිකිරි මැණිකේ
3. සුදු රෙදි හොරු, විකෘති, පුංචි අපට දැන් තේරෙයි.
4. අමර ගියා දිව්‍යලෝකේ, වලස් පවුල, අන්දරේලා
5. මහගිරිදඹ, පුත්‍ර සමාගම, වහලක් නැති ගෙයක් (.....)

40. කෙටි නාට්‍ය ගොනුව වන්නේ,

1. යුධ පිටියක සවාරියක්, දේවතා එළි, මකරා
2. මකරාක්ෂයා, මනරජංන වැඩ වර්ජන, ඔබ සපේක්ෂයි.
3. ඔබ සාපේක්ෂයි, චන්ද්‍රාවතී සමඟ රාත්‍රියක්, යක්කුරේ ඉස්කෝලේ
4. යක්කුරේ ඉස්කෝලේ, නාගගුරුලා, දෙවෙනි මහින්ද
5. දොරකඩ අස්න, ඈ තවම නෑ, ඒකා අධිපති (.....)

නාට්‍ය හා රංගකලාව

13 ශ්‍රේණිය - **I** පත්‍රය

II කොටස

◈A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

A - කොටස

01. i. නෘත්ත හා නෘත්‍ය අතර දක්නට ලැබෙන අසමානතා නම් කරන්න (ලකුණු 04 යි)

ii. නාට්‍ය පිළිබඳ පෙර අපර දෙදිග විද්වතුන්ගේ මත වෙන් වෙන්ව ඉදිරිපත් කරන්න. (ලකුණු 05 යි)

iii. නෘත්ත හා නෘත්‍ය ඉක්මවා යාමට නාට්‍යයට ඇති සුවිශේෂ හැකියාව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

02. i ප්‍රධාන රංග ශෛලීන් දෙක නම් කර එක් රංග ශෛලියකට අයත් ලක්ෂණ තුන බැගින් නම් කරන්න. (ලකුණු 04යි)

ii. නාට්‍ය ශාස්ත්‍රය විචාර ග්‍රන්ථයට අනුව සාත්වික හා අංගික අභිනයන් පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 05 යි)

iii. ප්‍රධාන රංග ශෛලීන්ට අනුව රූපණයේ යෙදීමේ දී සමාරෝපය වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

03. i. 'රංග පරම' සංගීතය යනු කුමක්ද? (ලකුණු 04 යි)

ii. නාට්‍යයක සාර්ථකත්වය සඳහා සංගීතය මගින් ඉටුවන මෙහෙය කරුණු වශයෙන් දක්වන්න.(ලකුණු 05 යි)

iii. ඔබ නරඹා ඇති නාට්‍යයක් ඇසුරින් සංගීත නිර්මාණයෙහි සාර්ථක, අසාර්ථක බව විචාරයට ලක් කරන්න. (ලකුණු 06 යි)

B- කොටස

04. i. සංස්කෘත නාට්‍යයේ රූපණය සම්බන්ධව දක්වා ඇති අර්ථෝපක්ෂේප හෙවත් ප්‍රයෝජ්‍ය කොටස් නම් කරන්න. (ලකුණු 04 යි)

ii. ඉන් කොටස් 03 ක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

iii. ඉහතින් II පිළිතුරෙහි සඳහන් කරන ලද ප්‍රයෝජ්‍ය දෙකක් ශාකුන්තලය නිදසුන් කොටගනිමින් විස්තර කරන්න.

(ලකුණු 06 යි)

05. i. ග්‍රීක හෝ ජපන් නාට්‍ය සම්ප්‍රදායට අයත් රංග භූමියක රූපසටහනක් ඇඳ කොටස් නම් කරන්න. (ලකුණු 04 යි)

ii. ඉන් කොටස් 02 ක් පිළිබඳව කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 05 යි)

iii. ඉහත ඔබ අඳින ලද රංගභූමිය අයත් රංග සම්ප්‍රදායේ රංග ශෛලිය පිළිබඳ විස්තර කරන්න.(ලකුණු 06 යි)

06. i. කෙටි නාට්‍ය හා ළමා නාට්‍ය සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

ii. ඉහත සංකල්ප 02 ට අයත් නාට්‍ය නිර්මාණකරුවන් දෙදෙනෙක් සහ ඔවුන්ගේ නිර්මාණ කෘතීන් 02 ක් බැගින් නම් කරන්න. (ලකුණු 05 යි)

iii. ළමා පෞරුෂය ගොඩනැගීම සඳහා නාට්‍ය හා රංග කලා විෂයට අයත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් වල යෙදීම කෙතෙක් දුරට ඉවහල් වන්නේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

57	S	II

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2018

Third Term Test - Grade 13 - 2018

විභාග අංකය ..... නාට්‍ය හා රංගකලාව II කාලය පැය තුනයි

උපදෙස්

- I කොටස II කොටසෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයා II කොටසේ පිළිතුරු පත්‍රයට අමුණා භාර දෙන්න.
- II කොටස A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

I - කොටස

- **නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

01. රටයකුම් යාගයේ කථා පුවතට අනුව ගින්නෙන් උපත ලැබූ මහ බඹුගේ බිරිය බවට පත් වන්නේ,
1. කොන්ඩමාල බිසවයි. 2. සපුමල් කුමාරි බිසවයි. 3. රිද්දි බිසවයි.
4. ඕංකාර බිසවයි. 5. ඉද්ද මල් කුමාරි බිසවයි. (.....)

02. රිද්දි යාගය සිදු කිරීමෙහි අරමුණක් නොවන්නේ,
1. ස්ත්‍රීන්ගේ වඳභාවය නැතිකොට ඔවුන්ට දරු සම්පත් ලබා දීම.
2. ගර්භනී ස්ත්‍රීන්ගේ ගර්භයට ආරක්ෂාව ලබා දීම.
3. දරු ප්‍රසූතිය පහසුවෙන් සිදු කිරීම සඳහා අවශ්‍ය මානසික ශක්තිය ලබා දීම.
4. රිද්දි බිසවුන්ට දරුවන් ලැබීම සංකේතවත් කිරීමට.
5. උපත ලැබූ දරුවාගේ ආරක්ෂාව තහවුරු කිරීම. (.....)

03. 'සන්නියකුම' යනු මිනිසුන් හා යක්ෂයන් අතර ඇති ගැටුමයි' යන ප්‍රකාශය කර ඇත්තේ,
1. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය. 2. දයානන්ද ගුණවර්ධන මහතා ය.
3. හෙන්රි ජයසේන මහතා ය. 4. ජයලත් මනෝරත්න මහතා ය.
5. ගුණසේන ගලප්පත්ති මහතා ය. (.....)

04. සූනියම් යාගයේ අන්තර්ගත අංග වන්නේ (පූජා විධි රටාවේ)
1. නානුමුරය, කපු සිටුවීම, වැල්වලලු තීන්දුව
2. දොරටු පැනීම, අට මඟල තීන්දුව, හත් අඩිය
3. සූනියම් වීදිය, කැප පිරිම, දරු නැලවිල්ල, සන්නි නැටීම
4. පුහුල් තීන්දුව, දොල පිදේනි දීම, වඩිගපටුන
5. තුන්යම පිදේනිය, නානුමුරය. බිසෝකප සිටුවීම (.....)

05. දෙවොල්මඩු යාගයේ ඇතුලත් නාට්‍යමය පෙළපාලි තුනක් අන්තර්ගත වරණය කුමක්ද?

1. යහන් දැක්ම, මරා ඉපැද්දවීම. පත්තිනි සවුදම
2. පත්තිනි යාගය, රාමා මැරීම, දොළහ පෙළපාලිය
3. අඹ විදමන, මරා ඉපැද්දවීම, රාමා මැරීම.
4. තෙල්මෙ නැටුම, මී බන්ධනය, සන්නි නැටුම
5. මුරුතැන් පිදීම, කාල පන්දම් පූජාව, අඹ විදමන (.....)

06. සොකරි නාටකය හා බැඳී ඇති විශ්වාසය වන්නේ,

1. මලය රජවරුන් පිළිබඳ සංකල්පයයි.
2. කතරගම දෙවි පිළිබඳ සංකල්පයයි.
3. උඩරට දෙවිවරුන් පිළිබඳ සංකල්පයයි.
4. පත්තිනි දේවිය පිළිබඳ සංකල්පයයි.
5. විනෝදාර්ථ සංකල්පයයි. (.....)

07. සොකරි නාටකයේ දී ගායනා කරන 'හිසේ කාපි මී මැස්සා - ඇසේ කාපි මී මැස්සා ' යන පද්‍ය සංවාද කණ්ඩයෙන් නිරූපණය වන්නේ,

1. ශබ්ද රසයයි. 2. උපහාසාත්මක රසයයි. 3. අර්ථ රසයයි.
4. ශෘංගාර රසයයි. 5. හාස්‍යෝත්පාදක රසයයි. (.....)

08. පණිවිඩ කරවනා - ලෙසට සබයට එමිනා
බස්තම රැගෙනනා - එන්ඩ සැරසී සබේ සිටිනා
ඉහත සඳහන් පද්‍යයෙන් හඳුන්වා දෙන කෝලම් චරිතය වන්නේ,

1. අණබෙර කෝලම 2. පේඩිවිදානේ ය. 3. ආරච්චි කෝලමය.
4. හේවා කෝලමය. 5. මුදලි කෝලමය. (.....)

09. නාඩගම් වලට යොදාගෙන ඇති ද්‍රවිඩ රාගතාල වන්නේ,

1. පාරනී හා කාලිප්පා 2. ධාදරා හා යමන් 3. පාරනී හා බිලාවල්
4. පසන් හා කාලිප්පා 5. හෙරවී හා සාරතී (.....)

- **පහත දැක්වෙන මාතෘකා ආශ්‍රය කර ගනිමින් ප්‍රශ්ණ අංක 10 සිට 16 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - පංචනාරිසට
B - දීපංකර බුදුන්
C - රූමත් කාන්තාව
D - සුරුවම් කර්මනය
E - බලිවාලා
F - පාලඟ
G - පේඩිරාළ
H - නල්ලසාමිගුරු
I - හෝසන්තා
J - මෝහන්ලාල්
K - බත් මාලාව
L - වෙල්ලිය අම්බලම
M - උනුනු පියන
N - වං ගෙඩිය

10. පාස්කු නාට්‍ය හා සම්බන්ධ වන්නේ,

1. E හා F ය. 2. D හා I ය. 3. I හා J ය.
4. I හා L ය. 5. J හා L ය. (.....)

11. නූර්ති හා සම්බන්ධ වන්නේ,

1. E හා J ය. 2. D හා J ය. 3. E හා I ය.
4. D හා I ය. 5. I හා F ය. (.....)

12. පහතරට ගර්භ සංරක්ෂණ ශාන්තිකර්ම හා සම්බන්ධ වන්නේ,

1. B හා F ය. 2. C හා M ය. 3. B හා M ය.
4. F හා M ය. 5. L හා N ය. (.....)

13. දෙවොල්මඩු ශාන්තිකර්මය හා සම්බන්ධ වන්නේ,

1. B හා M ය. 2. B හා L ය. 3. F හා N ය.
4. F හා L ය. 5. L හා N ය. (.....)

14. උඩරට ප්‍රධාන ගැමි නාටකය හා සම්බන්ධ වන්නේ,

1. B හා M ය. 2. E හා F ය. 3. C හා M ය.
4. F හා L ය. 5. C හා N ය. (.....)

15. පහතරට ප්‍රධාන ගැමිනාටකය හා සම්බන්ධවන්නේ,

1. A හා G ය. 2. F හා M ය. 3. C හා M ය.
4. F හා N ය. 5. L හා N ය. (.....)

16. උඩරට ප්‍රධාන ශාන්තිකර්මය හා සම්බන්ධ වන්නේ,

1. A හා M ය. 2. H හා K ය. 3. F හා L ය.
4. E හා M ය. 5. B හා M ය. (.....)

17. යුනිවර්සිටි කොලීජියේ 'ලංකා විශ්ව විද්‍යාලයේ සිංහල ශාස්ත්‍රීය' සමිතියේ ප්‍රදර්ශනය නොකරන ලද නාට්‍ය වන්නේ,

1. ජෝන්ද සිල්වාගේ දුටුගැමුණු නාට්‍ය
2. චාල්ස් ඩයස්ගේ මායාවතී නාට්‍ය
3. සී.දොන් බස්තියන්ගේ සත්‍යග්‍රහ නාට්‍ය
4. ජී.ජී අමරසීලි ද සිල්වාගේ 'මාලනී' නාට්‍ය
5. එච්. පියසේනගේ 'නගරෙන් කෙතට' නාට්‍ය (.....)

18. ටීටර් හා මිනර්වා නාට්‍ය සම්බන්ධ වැරදි ප්‍රකාශය කුමක්ද?

1. චිත්‍රපට කලාවේ ආගමනය පිරිහීමට බලපා ඇත.
2. මිනර්වා නාට්‍ය වල මුල් යුගයේ කාන්තා චරිත සඳහා පිරිමින් යොදාගෙන ඇත.
3. එඩී. ජයමාන්න, හියුගෝ ප්‍රනාන්දු මිනර්වා නාට්‍යට රංගනයෙන් දායක වී ඇත.
4. මධ්‍යම පාන්තික ජීවන රටාව විවරණය වන ආකාරයේ කතා පුවත් අන්තර්ගත වීම.
5. යථාර්ථවාදී හැසිරීම් වලින් යුත් වක්‍ර චරිත නාට්‍ය තුළ අන්තර්ගත වීම. (.....)

19. ශ්‍රී ලංකාවේ දෙමළ නාට්‍ය හා සම්බන්ධ වැරදි ප්‍රකාශය මින් කුමක්ද?

1. ලංකා සුබෝධ විලාස සභා 1913 දී කොළඹ පිහිටුවන ලදී,
2. 1964 දී මහාචාර්ය විද්‍යානන්දන් මහතා අතින් 'රාවනේසන්' නාට්‍ය බිහි විය.
3. 1978 දී බිහි වූ නාටක අරංකන් කල්ලුරි ආයතනයට එස්.මෞනගුරුගේ දායකත්වයද ලැබුණි.
4. 1974 දී බිහි වූ 'සංකරම්' සමකාලීන සමාජ ගැටළු තේමා කරගත් නාට්‍යයකි.
5. 1939 දී නිෂ්පාදිත 'අවර්ලංකා' හා 'රාමා ඇන්ඩ් සීතා' එම්. ශර්මුගලිංගම්ගේ නාට්‍යය වේ. (.....)

20. 1954 දී නිර්මාණ කරන ලද මාහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතාගේ ගුවන්විදුලි නාට්‍ය වන්නේ,

1. පබාවතී 2. වෙද හටන 3. රත්තරං
4. බහින කලාව 5. වදින්න ගිය දේවාලේ (.....)

21. පහත දැක්වෙන්නේ දෙමළ නාට්‍යය උත්සව හා සම්බන්ධ ප්‍රකාශයන් කිහිපයකි. ඉන් වැරදි ප්‍රකාශය වන්නේ,

1. තෛපොංගල් යනු පළමු මාසයට කිරි ඉතිරිවීමේ උත්සවයයි.
2. මාඩුපොංගල් උත්සවයේ ප්‍රමුඛස්ථානය ලැබෙන්නේ ගවයාටය.
3. නවරාත්‍රී මංගල්‍යය ප්‍රධාන වශයෙන් කාන්තාවන් උදෙසා පවත්වනු ලබයි.
4. දීපාවලී උත්සවය කාමන් හෙවත් අනංග උදෙසා පැවැත්වේ.
5. සිංහල අවුරුදු උත්සවයට සමගාමීව හින්දු අලුත් අවුරුදු උත්සවය ද පැවැත්වේ. (.....)

- **ප්‍රශ්න අංක 22 සිට 26 දක්වා ප්‍රශ්න වලට පහත වරණ ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.**

A - ඔරෙස්ටියා ත්‍රිත්වය	F - වෙරිවන්ත	K - මිඩි සම(ර්)නයිට්ස්ඩ්‍රීම්
B - ස්වප්න වාසවදත්තා	G - දෙවෙනි එඩේරා	L - සුමිද නදිය
C - ඇන්ටිගනී	H - දෝජෝ විහාරය	M - කන්ජින්චෝ
D - මීඩියා	I - චේටිංෆෝ ගෝඩෝ	N - මැක්බත්
E - කොකේසියන් චෝර්ක් සර්කල්	J - අභිඥාන ශාකුන්තලය	O - රූකඩ ගෙදර

22. ග්‍රීක නාට්‍ය කලාවට අයත් නාට්‍ය වන්නේ,

1. C, D හා I ය. 2. E, G හා I ය. 3. A, K හා N ය.
4. A, D හා M ය. 5. A, C හා D ය. (.....)

23. සංස්කෘත නාට්‍ය කලාවට අයත් වන්නේ,

1. A හා F ය. 2. H හා M ය. 3. B හා J ය.
4. J හා O ය. 5. H හා L ය. (.....)

24. මධ්‍යකාලීන යුරෝපීය හෙවත් ජනවන්දනා හා ශේක්ස්පියර් නාට්‍ය පිළිවෙලින් වන්නේ,

1. G හා K, N ය. 2. K හා M, O ය. 3. O හා K, H ය.
4. E හා J, L ය. 5. I හා C, D ය. (.....)

25. අඛ්‍යාන රංග රීතියට හා යථාර්ථවාදී රංග රීතියට අයත් නාට්‍ය පිළිවෙළින්,

1. E හා F, O ය. 2. K හා L, M ය. 3. J හා N, I ය.
4. H හා A, B ය. 5. O හා N, L ය. (.....)

26. නෝ හා කබුකි නාට්‍ය වන්නේ පිළිවෙලින්,

1. A, C හා N ය. 2. H, L හා K ය. 3. J, H හා M ය.
4. H, L හා M ය. 5. H, K හා N ය. (.....)

27. ජුලියස් සීසර් නාට්‍යට අයත් පහත ප්‍රකාශයන්ගෙන් 'මාර්ක් ඇන්ටනී' ගේ ප්‍රකාශය කුමක්ද?

1. සීසර් මට ආදරය කළ තරමට මා ඔහු ගැන වැළපෙනවා.
2. නිර්භීත මිනිහෙක් මරණයේ මිහිර විඳින්නෙ එක පාරයි.
3. අනේ දෙවියනේ ඔහු බෘටස්ට මොන තරම් ආදරය කලාද?
4. බෘටස් ඔබත්, එහෙනම් සීසර් වැටුනාදෙන්.
5. මා ඔහු මරා දැම්මා, ඔහු උන්නතිකාමියෙකු වූ නිසා (.....)

28. 'දැන් මම මුහුදුබත් වෙච්ච නැවක, කඳක් බදාගෙන පණ බේරගන්න දඟලන මිනිහෙකුට දෙවෙනි නැහැ.' මෙම ප්‍රකාශය කරන ලද්දේ,

1. කෘග්ස්ටාඩ් 2. නුවුරා 3. හෙල්මර්
4. දොස්තර රැන්ක් 5. ලින්ඩේ මිය (.....)

29. සුභ සහ යස හා හස්තිකාන්ත මන්තරේ යන නාට්‍යයන්ට අයත් පහත ප්‍රකාශනයන්ගෙන් නිවැරදි පිළිතුර ප්‍රකාශය වන්නේ,

1. නාට්‍ය අවසානයේ සුභ දැහැමි රජෙක් බවට ඉඟි පළකරන අතර උදයන රජු බල කාමියෙකි.
2. යස බිසව රාජ්‍ය පාලනයට ප්‍රබල ලෙස සම්බන්ධ වූ අතර චණ්ඩප්පජ්ජෝත රජ බිසව රජුට එරෙහිව සිටියාය.
3. යස මධුපානයෙන් තොර වූ අතර චණ්ඩප්පජ්ජෝත රජු මධු පානයට ලොල් විය.
4. යස ජීවිතයේ අර්ථ ශූන්‍ය බව පසක් කරගත් අතර චණ්ඩප්පජ්ජෝත රජු බලකාමියෙකු විය.
5. සුභ සහ යස බිසව මෙන්ම උදයන හා වාසවදත්තා ප්‍රේමයෙන් වෙලී සිටියාය. (.....)

30. 'ආ උඹ ඒ ගැන කණගාටු වෙන්න එපා. මම උගේ පස්සෙන් යන්නෙ මගේ වාරෙ ආවම උෆට දෙන්න හිතාගෙන' මෙම ප්‍රකාශය කියන ලද්දේ,

1. සුභ සහ යස නාට්‍යයේ සුභය.
2. ජුලියස් සීසර් නාට්‍යයේ කැසියස් ය.
3. ඔතෙලෝ නාටයයේ ඉයාගෝය.
4. ඇන්ටිගනී නාට්‍යයේ සෙබළාය.
5. රූකඩ ගෙදර නාට්‍යයේ කෘග්ස්ටාඩිය. (.....)

31. දෙස් විදෙස් අසම්මත නාට්‍යකරුවන් පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී සැමුවෙල් බෙකට්ගෙන් සිදු වූ සේවය විශේෂිතය. ඔහු විසින් රචනා කරන ලද නාට්‍ය කෘති වන්නේ,

1. වේටිං ෆෝ ගොඩෝ, හැපී ඩේස්, එන්ඩ්ගේම්
2. ද ත්‍රීපෙනි ඔපෙරා, ගැලීලියෝ, හැපීඩේස්
3. කොකේසියන් චෝ(ර්)ක් සර්කල්, එන්ඩ්ගේම්, ගැලීලියෝ
4. ඉලියුතේරිය, මර්ෆී, ගැලීලියෝ
5. ඔතෙලෝ, ඉලියුතේරිය, වේටිං ෆෝ ගොඩෝ (.....)

32. නෝර්වීජියානු නාට්‍යකරුවෙකු වූ හෙන්රික් ඉබ්සන් යථාර්ථවාදී නාට්‍ය සම්ප්‍රදායේ පියා ලෙස සැලකේ, ඔහුගේ නාට්‍ය කෘති කිහිපයක් වන්නේ,

1. මුහුදු ලිහිණියා, සමාජයේ කුළුණු, ද වෙඩිං
2. ද බෙයාර්, අවතාර, වාන්යා මාමා
3. ජුලියස් සීසර්, චෙරි ඔර්චර්ඩ්, සමාජයේ කුළුණු
4. සමාජයේ කුළුණු, ඩෝල්ස් හවුස්, ලේඩි ෆෝර්ම් ද සී
5. අවතාර, චෙරි ඔර්චර්ඩ්, ලේඩි ෆෝර්ම් ද සී (.....)

33. සෑම නාට්‍ය සම්ප්‍රදායකට ම ඊට ආවේණික වූ නාට්‍ය ප්‍රභේද දක්නට ලැබේ. ශෝක්ස්පියර්ගේ නාට්‍ය අයත් වන්නේ,

1. සුඛාන්ත, ඓතිහාසික හා ප්‍රහසන
2. ශෝකාන්ත, ඓතිහාසික හා ප්‍රහසන
3. ශෝකාන්ත, සුඛාන්ත හා ඓතිහාසික
4. ශෝකාන්ත, සුඛාන්ත හා ප්‍රහසන
5. ශෝකාන්ත, සුඛාන්ත හා සටුර (.....)

34. පශ්චාත් දෘෂ්ටිකථන ස්වරූපය දක්නට ලැබෙන්නේ පහත දැක්වෙන කවර නාට්‍ය සම්ප්‍රදායකද?

1. අභූතරූපී නාට්‍ය
2. එලිසබතීන නාට්‍ය
3. ජපන් නෝ නාට්‍ය
4. කුරිරු රංගය
5. ග්‍රීක ට්‍රැජඩි නාට්‍ය (.....)

35. හස්තිකාන්ත මන්තරේ නාට්‍යට පදනම් වූ කථාව අන්තර්ගත ලංකේය මූලාශ්‍රය වන්නේ,

1. මහා වංශය හා දීපවංශය
2. පාලි ධම්මපදට්ඨ කථාව හා ප්‍රතිඥයෞගන්ධරායණය
3. සද්ධර්ම රත්නාවලිය හා පාලි ධම්ම පදට්ඨ කථාවය
4. දීපාවලිය හා ජාතක පොතයි.
5. ජාතක පොත සහ සද්ධර්මරත්නාවලියයි. (.....)

- **පහත දැක්වෙන පින්තූර ආශ්‍රය කර ගනිමින් අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න වලට පිළිතරු සපයන්න.**


A


B


C

D

E

36. කලාව පිළිබඳව ඉපැරණිම නිර්වචනය ඉදිරිපත් කළ මහා ග්‍රීක නාට්‍ය විචාරකයා දැක්වෙන්නේ,

1. A 2. B 3. C 4. D 5. E (.....)

37. අසම්මත නාට්‍ය, අභූතරූපී, විකාරරූපී යන නම් වලින් ද හඳුන්වයි. ප්‍රකට අසම්මත නාට්‍ය නිර්මාණකරුවෙක් දැක්වෙන්නේ,

1. A 2. B 3. C 4. D 5. E (.....)

38. එපික් රංග රීතිය හඳුන්වා දුන් නාට්‍යකරුවා දැක්වෙන්නේ,

1. A 2. B 3. C 4. D 5. E (.....)

39. 'කලාව යනු අනුකරණයක තවත් අනුකරණයකි' යනුවෙන් පවසන ග්‍රීක දාර්ශනිකයා වන්නේ ප්ලේටෝය. ඔහු දැක්වෙන්නේ,

1. A 2. B 3. C 4. D 5. E (.....)

40. 'නව රූපණ විධි ක්‍රමය' හඳුන්වා දුන් නාට්‍යකරුවා දැක්වෙන්නේ,

1. A 2. B 3. C 4. D 5. E (.....)

තෙවන වාර පරීක්ෂණය - 2018

නාට්‍ය හා රංගකලාව

13 ශ්‍රේණිය - **II** පත්‍රය

II කොටස

◈A හා B කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

A - දේශීය නාට්‍ය කලාව

01. i. ශ්‍රී ලංකාවේ පහතරට ශාන්තිකර්ම වල අන්තර්ගත නාට්‍යමය ලක්ෂණ 04 ක් ලියන්න. (ලකුණු 04 යි)
    ii. පහතරට හා සබරගමු ප්‍රදේශවල ප්‍රචලිත ශාන්ති කර්ම දෙකකින් නිදසුන් සපයමින් ඔබ ඉහත (i) හි නම් කළ නාට්‍යමය ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
    iii. නාට්‍යමය ලක්ෂණයන්ගෙන් අනූන පහතරට ශාන්ති කර්මයක් තෝරාගෙන එහි වේෂභූෂණය හා සංවාද භාවිතය පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

02. i. කෝළම් නාටකයේ අනුකරණ අවස්ථා 04 ක් නම් කරන්න. (ලකුණු 04 යි)
    ii. කෝළම් කතා ප්‍රවෘත්තිය රංගමය ස්වරූපයෙන් විකාශනය කිරීමේදී ඔබ සඳහන් කළ අනුකරණ අවස්ථා කථාව හා සම්බන්ධ කර ගනිමින් නාට්‍යමය ගුණය මතු කරන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
    iii. කෝළම් නාටකය හා සොකරි නාටකය අතර ඇති සම්බන්ධතාවය සංසන්දනය කරන්න. (ලකුණු 06 යි)

03. i. සුභ සහ යස හා හස්තිකාන්ත මන්තරේ නාට්‍යවල තේමාවන් කෙටියෙන් දක්වන්න. (ලකුණු 04 යි)
    ii. ඉහත එක් නාට්‍යයකින් සමාජයට ලැබෙන පණිවිඩය හා ඉන් ජීවිතයට ගත හැකි ආදර්ශ මොනවාදැයි පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)
    iii. ඉහත නාට්‍ය දෙකින් ඔබ කැමති නාට්‍යයක් තෝරාගෙන එකී නාට්‍යයෙන් පිළිබිඹු වන ජීවන දෘෂ්ටිය හා එය ඉස්මතුකොට දැක්වීම සඳහා නාට්‍යකරුවා යොදාගත් නාට්‍යෝචිත උපක්‍රම පිළිබඳ විග්‍රහ කරන්න. (ලකුණු 06 යි)

B - කොටස

04. i. අභිඥාන ශාකුන්තලයට පාදක වූ මූලාශ්‍රය සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)
    ii. මෙම නාට්‍යයේ එන නේතෘගේ චරිත ලක්ෂණ විග්‍රහ කරන්න. (ලකුණු 05 යි)
    iii. අභිඥාන ශාකුන්තලයට පාදක වූ මූලාශ්‍රයට, කාලිදාසයන් විසින් නාට්‍ය නිර්මාණයේ දී කර ඇති වෙනස්කම් මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

05 i. 19 වන සියවසේ බිහි වූ යථාර්ථවාදී රංග රීතියට අයත් නාට්‍යකරුවන් දෙදෙනෙකු නම් කොට ඔවුන්ගේ නාට්‍ය නිර්මාණ දෙක බැගින් නම් කරන්න. (ලකුණු 04 යි)
    ii. රූකඩ ගෙදර නාට්‍ය ඇසුරෙන් යථාර්ථවාදී රංග රීතියට අයත් ලක්ෂණ ලියා දක්වන්න. (ලකුණු 05 යි)
    iii. ටෝවල්ඩ් හුදු සම්ප්‍රදායට වහල් වූවකු ලෙසත් නුවුරා හුදු සම්ප්‍රදායික නොවන කාන්තාවක් ලෙසත් රූකඩ ගෙදර නාට්‍යයේ නිරූපණය කර ඇත. නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

06. i. විලියම් ශේක්ෂ්පියර් විසින් නිර්මාණය කරන ලද ශෝකාන්ත නාට්‍ය 04 ක් නම් කරන්න. (ලකුණු 04 යි)
    ii. ඔබට නියමිත ශේක්ෂ්පියර්ගේ ශෝකාන්ත නාට්‍ය දෙකක දෘශ්‍යමාන සමාන ලක්ෂණ සඳහන් කරන්න. (ලකුණු 05 යි)
    iii. ඉහත සඳහන් කරන ලද නාට්‍ය දෙකින් වඩාත් සංවේදී නාට්‍ය ලෙස ඔබ සඳහන් කරන්නේ කුමක්දැයි සහේතුකව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

නාට්‍ය හා රංගකලාව 2018 - තෙවන වාර පරීක්ෂණය

13 ශ්‍රේණිය - I පත්‍රය

---

1 කොටස - පිළිතුරු

1.	3	11.	2	21.	5	31.	1
2.	4	12.	4	22.	4	32.	4
3.	1	13.	2	23.	2	33.	5
4.	2	14.	5	24.	1	34.	2
5.	5	15.	3	25.	3	35.	3
6.	3	16.	2	26.	2	36.	3
7.	4	17.	1	27.	1	37.	1
8.	1	18.	2	28.	4	38.	4
9.	4	19.	5	29.	5	39.	2
10.	5	20.	4	30.	5	40.	3

1 පත්‍රය - 11 කොටස.

A– කොටස

01. i. නෘත්ත
හුදු නර්තනයක් පමණි.
අර්ථ ප්‍රකාශනයක් නැත.
සාත්වික අභිනය භාවිතා නොවේ.

නෘත්‍ය
භාව ප්‍රකාශනාත්මක නර්තනයකි.
අර්ථ ප්‍රකාශනයක් ඇත.
සාත්වික අභිනය භාවිතා වේ. (ල. 04)

ii. පෙරදිග
නාට්‍ය යනු ලෝකයාගේ පැවැත්ම අනුකරණ කිරීමකි. - භරතමුනි -
නාට්‍ය යනු අවස්ථාවක් අනුකරණය කිරීමකි. - ධනංජය -
නාට්‍ය වූ කලී සංගීත, නර්තනය, දෙබස්, රඟපෑම්, වේෂනිරූපණ, අංගරචනය, ආදී කලාත්මක මාධ්‍යයන් මඟින් ප්‍රේක්ෂකයා තුළ කිසියම් සෞන්දර්යාත්මක අත්දැකීමක් දැනවීමට යන්න දරන්නා වූ සම්පූර්නයෙන් වෙනස් වූ කලාත්මක නිර්මාණයකි. - අභිනව ගුප්ත -
අපරදිග
නාට්‍ය යනු ක්‍රියාවක් අනුකරණය කිරීමයි. - ඇරිස්ටෝටල් -
නාට්‍ය යනු ජීවිතයේ පිටපතකි - සිරිත් විරිත් වල කැඩපතකි. - ඇලඩයිස් නිකොල් -
නාට්‍ය යනු ජීවිතයේ පැතිකඩකි. - බර්නඩ් ෂෝ -

iii. නාට්‍යයකදී සතර අභිනයකදී යොදාගත හැකිය.
සංකල්පයක් / අදහසක් / අත්දැකීමක් / සත්‍ය සිදුවීමක් / කල්පිත පුවතක් / පුරාවෘත්තයක් හෝ ඓතිහාසික සිදුවීමක් නට්‍යෝචිත අවස්ථා මතුවන පරිදි නිර්මාණය කළ හැකිය.
විවිධ පරිසර යුග කාලාවකවානු අවශ්‍ය පරිදි නිරූපණය කළ හැකිය. චරිතවල සංකීර්ණ ගති ලක්ෂණ නිරූපණය කල හැකිය.
චරිතවල සියුම් මනෝ ගති, මනෝභාව, ඉස්මතු කල හැකිය.
චරිතාන්තර ගැටුම් අවස්ථා විවිධාකාරයෙන් ඉදිරිපත් කල හැක.
විවිධ ශෛලීන්ට හා රංග රීතීන්ට අනුව නාට්‍ය නිෂ්පාදන කළ හැකිය.
නාට්‍ය ආකෘතිය / සංදර්භය නොයෙක් ආකාරයට සැකසිය හැකිය.
පැය කිහිපයක් හෝ අඛණ්ඩව රඟ දැක්විය හැකිය.

02. i. නාට්‍ය ධර්මී ශෛලිය

තාලානුකූල ගමන් රටා, පරික්ක්‍රමණය, කක්ෂ්‍යා මාරුව, ආත්ම භාෂණ
ගීත, පද්‍ය සංවාද ඇත.
පසුතල නොමැති වීම, පද්‍යයෙන් හා ගීතයෙන් පසුතල මවාපෑම.
පෙතේගුරෙකු හා අත්වැල් ගායක කණ්ඩායමක් සිටීම.
සංගීතය අත්‍යාවශ්‍ය වීම.

ලෝකධර්මී ශෛලිය.

ස්වභාවික හැසිරීම් රටා
ස්වභාවික සංවාද
තත්වානුරූපී මායාවෙන් යුතු වීම.
ස්වභාවික රංග වස්ත්‍ර, අංග රචනය
නාට්‍යෝපකරණ හා පසුතල භාවිතය.

ii. සාත්වික භාව අටකි.

ස්ථම්භ, රෝමාංච, වේපථ, ස්වරභංග, ස්වේද, අශ්‍රු, වෛවර්ණ්‍ය, තාප, ප්‍රලය

ආංගික අභිනය

අංග, ප්‍රත්‍යාංග. උපාංග

චාරි, ස්ථානක, හස්ත, කරණ ආදී ප්‍රභේද 04 කි.

iii. ප්‍රශ්නයට අදාලව කරුණු දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

03. i. රංග පරම සංගීතය යනු නාට්‍යයේ යටිපෙළ අරුත් ගන්වන ලෙස නිර්මාණය කරන සංගීතයයි.

ii. නාට්‍යයක සංගීතය, ආහාර්ය අභිනයට අයත් වේ. උපක්‍රමයක් ලෙස විවිධ ශබ්ද, නාද හඬවල් සංකලනය කර ගැනීම.
නාට්‍යයේ මතුපිට අර්ථයට වඩා ගැඹුරු අරුතක් මතු කිරීමට නාට්‍ය සංගීතය උපකාරී වේ.
ප්‍රාසංගිකය, ජවනිකා මාරු කිරීම සඳහා ද සංගීතය භාවිතය කරයි.
අංකවල සබඳතා, හිස්බව මකා ගැනීමට නාට්‍යයේ ඒකාබද්ධතාවය රඳවා ගැනීමට සංගීතය භාවිතා කළ හැකිය.

iii. ප්‍රශ්නයට අදාලව කරුණු ගොනු කර ඇත්නම් නියමිත ලකුණු ලබාදෙන්න.

B - කොටස

04. i. ප්‍රවේශක, විෂ්කම්භක, චූලිකා, අංකාවතාර, අංකමුඛ (ල. 04)

ii. කොටස් 03 ක් නිවැරදිව පැහැදිලි කර ඇත්නම් සම්පූර්ණ ලකුණු ලබා දෙන්න. (ල. 05)

iii. අපේක්ෂකයා ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගෙන නිදසුන් සහිතව පිළිතුරු ඉදිරිපත්කොට ඇතිනම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

05. i නිවැරදි පිංතූර ඇඳ කොටස් නම් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 04)

ii. අපේක්ෂකයා තෝරාගෙන ඇති කොටස් 02 පිළිබඳව නිවැරදිව පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

iii. අපේක්ෂකයා තෝරා ගන්නා ලද රංග සම්ප්‍රදායට අයත් රංග ශෛලිය විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

06. i **ළමා නාට්‍ය** - අවුරුදු 3 - 14 ත් අතර වයස් කාණ්ඩයට අයත් ළමුන්ගේ මනෝභාවයන්, හැසිරීම්, ක්‍රියාකාරකම් වලින් යුතු ළමා මනසට ගෝචර වූ කථාවක් යොදාගත් එම වයස් මට්ටමට ගැළපෙන සදාචාරාත්මක කරුණු ඉස්මතු වන නාට්‍ය කලාවකි.

කෙටි නාට්‍ය - ඒකාංගික වූ ද ප්‍රබල නාට්‍ය ප්‍රස්තුතයක් කෙටි කාලයක් තුළ අවම චරිත ප්‍රමාණයකින් ප්‍රබල ගැටුමක් හා රූපණයක් තුළින් අවස්ථාවක් ප්‍රතිනිර්මාණය කිරීම. (ල.04)

ii. **ළමා නාට්‍ය** - සෝමලතා සුබසිංහ - තොප්පි වෙළෙන්දා, පුංචි අපට දැන් තේරෙයි, හිම කුමරි
පාලිත ලොකුපෝතාගම - අමර ගියා දිව්‍ය ලෝකේ, නෙළුම් කුමාරි, කාවෝ කෑවෝ

කෙටි නාට්‍ය - මංගල සේනානායක - යක්කුරේ ඉස්කෝලේ, සාදු, පොඩි සාදු, ඔබද මමද, මාරහිත, ඔන්න හොරෝ කවි

ධනංජය කරුණාරත්න - ඔබ සාපේක්ෂයි, චන්ද්‍රවතී සමඟ රාත්‍රියක්. (ල. 05)

iii. අපේක්ෂකයා ප්‍රශ්නයට අදාලව කරුණු ගොනු කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.06)

නාට්‍ය හා රංගකලාව

13 ශ්‍රේණිය - II පත්‍රය

I කොටස - පිළිතුරු

1. 3	11. 1	21. 4	31. 1
2. 4	12. 3	22. 5	32. 4
3. 2	13. 4	23. 3	33. 3
4. 2	14. 5	24. 1	34. 5
5. 3	15. 1	25. 1	35. 3
6. 4	16. 2	26. 4	36. 3
7. 5	17. 3	27. 3	37. 5
8. 3	18. 5	28. 1	38. 4
9. 1	19. 5	29. 4	39. 1
10. 2	20. 3	30. 3	40. 2

II කොටස - පිළිතුරු

A - දේශීය නාට්‍ය කලාව.

01. i. සතර අභිනය, සමාරෝපය, අනුරූපණය, අනුකරණය, අවස්ථා නිරූපණය, රංගභූමි අලංකරණය, වේෂ නිරූපණය, රංගෝපකරණ (ල. 04)

ii. පහතරට ශාන්තිකර්ම
සන්නියකුම :- සූනියම් යක්ෂණියගේ අවතාර, සන්නියකුන්ගේ පැමිණීම, පැදුරේ දැපවිල්ල
රිද්දියාගය (රටයකුම)
නානුමුරය හෙවත් දොළහ පෙළපාලි, කපුයක්කාරිය
සූනියම් යාගය - වඩිග පටුන
දෙවොල් මඩුව - අඹ විදමන, මරා ඉපැද්දවීම, රාමා මැරීම.
සබරගමු ශාන්තිකර්ම
පහන් මඩුව - රාමා යක්කම, අඹ විදමන, දෙවොල් ගොඩ බැසීම, කුරුම්බර නැටීම, හත්පදය නැටීම.
කිරිමඩුව - ඇත් බන්ධනය. මී බන්ධනය, මුරුතැන් තැබීම, ආඩි ගුරු නැටීම, මංගර සමයම.
ඉහත නිදසුන් වලින් නාට්‍යමය ලක්ෂණ දෙකක් පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

iii. තෝරාගත් ශාන්තිකර්මයට අදාළව කරුණු ගොනු කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.06)

02. i. චරිත වලට ආවේණික වූ ගමන් තාල අනුකරණය, සමාජයේ විවිධ චරිත වල හැසිරීම් රටා අනුකරණය, ඇඳුම් පැළඳුම් හා නාට්‍යෝපකරණ අනුකරණය, ආදී වශයෙනි. (ල. 04)

ii. ඉහත අනුකරණාත්මක අවස්ථා කථාව හා සම්බන්ධ කර ගනිමින් නාට්‍යමය ගුණය මතුවන ආකාරය පැහැදිලි කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

iii.
- ගර්භ පූජා ලක්ෂණ අන්තර්ගත වීම.
- පූජාර්ථය හා විනෝදාස්වාදය අන්තර්ගත
- කවි හා නාදමාලා අන්තර්ගත වීම.
- පිරිමින් පමණක් රංගනයේ යෙදීම.
- එළිමහන් රංගභූමි භාවිතකිරීම.
- සශ්‍රීකත්වය හා සෞභාග්‍ය සංකේතවත් කිරීම.
- හාස්‍ය හා උපහාසය උපදවීම.
- රංග ශෛලිය - නාට්‍යධර්මී වීම.
- රාත්‍රිය පහන් වනතුරු රඟ දැක්වීම.

(ල.06)

03. i.
- සුභ සහ යස - පාලකයා වෙනස් වූ පමණින් රාජ්‍ය තන්ත්‍රය වෙනස් නොවන බවත්, කිරීටය. හෑල්ලුවට ලක් කරගත් රජකෙනෙකුගේ ඇඳ වැටීමත්.
- හස්තිකාන්ත මන්තරේ - රාජ්‍ය බලය වර්ධනය කර ගැනීම සඳහා ඕනෑම උපායක් යොදාගැනීම නිවැරදි යයි සිතූ රජ කෙනෙකුගේ ඇද වැටීම.

ii. **සුභ සහ යස**
- පණිවිඩ - මිනිස් ආකල්ප හා සිතුවිලි ක්‍රියාත්මක වන ආකාරය
- කැරලිකරුවන්ගේ ස්වභාවය
- මිනිසාගේ අවස්ථාවාදී බව.
- ජීවිතය නිරන්තරයෙන් අර්ථශූන්‍ය බව දැකීමේ විපාක
- ස්ත්‍රී ලෝලිත්‍යය හා මධු ලෝලිත්වයේ හානිකර බව.
- අන්ධ විශ්වාසය, ව්‍යාජත්වය, බොරුව, ඕනෑම තැනක රජකරන බව., අමාත්‍ය මණ්ඩල ගැති බව
- ආදර්ශ - මිනිස් සිතුවිලි හඳුනාගැනීමට උත්සාහ කිරීම.
- වර්තමාන දේශපාලන ව්‍යුහයේ ස්වභාවය වටහා ගැනීම.
- යහපත් පාලන තන්ත්‍රයට ස්ත්‍රී හා මධු ලෝලිත්වය නොගැලපෙන බව

- රජකම වූ කලී භාරධුර කර්තවයක් බව.
- බොරුව, ව්‍යාජත්වය, අන්ධ විශ්වාසයෙන් තොර වීම.

හස්ති කාන්ත මන්තරේ පණිවිඩ - බල තණ්හාව වෙනුවෙන් ඕනෑම ක්‍රියාවලියකට පෙළඹීම.
සත්‍යවාදිය, ජයගන්නා බව.
උගත්කම බලෙන් ලබාගත නොහැකි බව.
කෙතරම් බාධක හමුවේ වුවද ප්‍රේමය ජයගන්නා බව.

ආදර්ශ - දෙමව්පියන්ට කීකරු විය යුතු බව.
බල තණ්හාව විනාශය ලගා කරන ආකාරය
උපක්‍රමශීලි විය යුතු බව.
ස්ථානෝචිත ප්‍රඥාවෙන් යුක්ත විය යුතු බව.

iii. අපේක්ෂකයාගේ පිළිතුරෙහි කරුණු අනුව ලකුණු ලබා දෙන්න. (ල.06)

04. i.
- මහා භාරතයේ, ආදී පවන්හී, ශාකුන්තලෝපාඛ්‍යානය ඇසුරු කොටගෙන තිබේ.
- දුෂ්‍යන්ත නිතර දඩ කෙළියෙහි යෙදෙන විනාශකාරී පුද්ගලයෙකි. දඩයමෙහි ගිය දිනෙක රජුට තපෝ වනයේදී ශකුන්තලා මුණ ගැසේ. ඇයගේ උපත සෘෂිවරයෙකුගේ හා අප්සරාවකගෙන් සිදු වූ බැවින් රාජ ශ්‍රී වූ රජුට
- විවාහය සඳහා බව තීරණය කර ගාන්ධර්ව විවාහයක් සඳහා යෝජනා කරයි.
ශකුන්තලා රජු සමඟ එක් වන්නේ දරුවෙකු පිළිසිඳුනහොත් දරුවන්ට යුව රාජ තනතුර දිය යුතු බවට වන පොරොන්දුව මතය.
- ශාකුන්තලා ගැබ් ගනී. ඇය පුතෙකු බිහි කරයි. දරුවාට අවු. 06 ගතවනතුරු ද දුෂ්‍යන්ත නොපැමිණි බැවින් ශාකුන්තලා තම පුතු වන භරත කැටුව හස්තිනාපුරයට යයි. එහෙත් දුෂ්‍යන්ත ඔවුන් ප්‍රතික්ෂේප කරයි. අහසින් ආ හඬකට බිය වූ රජු දරුවා සමඟ ශකුන්තලා භාරගනියි. (ල. 04)

ii.
- ධීර ලලිත චරිතයකි.
- උත්තම සම්භවයකින් යුත් පුද්ගලයෙකි.
- ප්‍රේමයට හා ආලයට ලැදි පුද්ගලයෙකි.
- විනෝදකාමී පුද්ගලයෙකු වීම.

ආදී වශයෙන් චරිත ලක්ෂණ ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 05)

iii.
- මුලාශ්‍රයට අනුව දුෂ්‍යන්ත රජු ශාකුන්තලාව ගාන්ධර්ව විවාහයෙන් එක්වී පසුව නැවත නොපැමිණෙයි. දුෂ්‍යන්ත රජු, අවස්ථාවලදී කපටි චරිතයක් ලෙස දක්වා ඇත.
- වයස අවුරුදු 06 ක් දරුවා සමඟ ශකුන්තලා රජු හමුවට ගියද, ඔහු දරුවා ගැනීම ප්‍රතික්ෂේප කරයි. එහිදී අහසින් කියවුණු ප්‍රකාශයට බිය වී රජු ඔවුන්ව භාර ගනී.
- මුලාශ්‍රයේ ඇත්තේ චරිත 04 ක් පමණි.
(දුෂ්‍යන්ත, ශකුන්තලා, කණ්ව, භරත)
- දුර්වාසස් සෘෂිවරයාගේ ශාපය
- ශාකුන්තලා රජු වෙත යන්නේ ගර්භණී සමයේ දීමය. රජුට ඇයව හඳුනා ගැනීමට නොහැකි වේ.
- මුදුව පැළඳීම, ශාපය, ධීවරයා හා බැඳුණු සිදුවීම, දරුවා මුණු ගැසීම, දුෂ්‍යන්ත රජු ශකුන්තලාගෙන් සමාව අයැදීම, මාරීව අසපුවේ දී ඔවුන් දෙදෙනා විවාහ කර දීම. කාලිදාසයන් විසින් සිදු කරන ලද වෙනස්කම්ය.
- නව චරිත ගණනාවක් කාලිදාසයන් විසින් එකතු කර තිබීම. (ල.06)

05. i. හෙන්රික් ඉබ්සන් - සමාජයේ කුලුණු, සෙල්ලම්ගේ, කැටලීනා
ඇන්ටන් චෙකොෆ් - ඉවනොව්, මුහුදු ලිහිණියා, චෙරිවත්ත
ඕගස්ට් ස්ට්‍රින්බර්ග් - යුලි මෙනවිය, පීතෘ (ල.04)

ii. යථාර්ථවාදී රංග රීතියට අයත් ලක්ෂණ
1. ගතානුගතික තේමාවක් හා චරිත ද අද්භූත හා අභව්‍ය දේ ද, අතහැර කාලීන මිනිස් ජීවිතයේ සැබෑ තතු වඩාත් තාත්වික ලෙස වේදිකාව මත නිරූපණය කිරීම.
2. චරිත හා සිදුවීම්වල විකාශනය සහේතුක වීම.
3. චරිත පැතලි බවින් තොරවීම.
4. කාලය හා අවකාශය තර්කානුකූලව ගලපා තත්වානුරූපී මායාවට යටත් කොට ඉදිරිපත් කිරීම.
5. සාමාන්‍ය භාෂා භාවිතයක් අන්තර්ගත වුවද ඒ තුළ කාව්‍යාත්මක ලක්ෂණ පැවැතීම. ආදී කරුණු ලියා ඇතිනම් (ල.05)

iii. අපේක්ෂයා රූකඩගෙදර නාට්‍ය ඇසුරින් නිදසුන් දක්වා පිළිතුර ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල. 06)

06. i. ඔතෙලෝ, ජුලියස් සීසර්, හැම්ලට්, මැක්බත්, ලියර් රජු (ල.04)

ii. සමාන ලක්ෂණ සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.
අංක 05 කින් යුක්ත වීම, සියලුම චරිත ප්‍රබල වීම.
කාව්‍යමය බස් වහරක් යොදා ගැනීම.
හොල්මන්, අවතාර, වැනි දෑ අන්තර්ගතවීම. (ල.05)

iii. අපේක්ෂකයා විසින් තෝරාගන්නා ලද නාට්‍යයට අදාලව කරුණු දක්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.06)